2023 ජනවාරි

## MMCA ශ්‍රී ලංකාහිදී ශ්‍රී ලාංකික සමකාලීන කලාවට සහාය වීම

ශ්‍රී ලංකාවේ සමකාලීන කලාව දේශීය හා ජාත්‍යන්තර මට්ටම් දෙකෙහි ම වැඩි වැඩියෙන් පිළිගැනීමකට ලක්වෙමින් පවතී. ශ්‍රී ලාංකික නූතන හා සමකාලීන කලාව ප්‍රදර්ශනය කිරීමට කැපවී සිටින රටේ ප්‍රථම හා එක ම කෞතුකාගාරයවන ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) යනු, ඒවාට සහාය වීමේ අවශ්‍යතාව පිළිබඳව දැනුවත් කිරීමේ හා සිය ප්‍රේක්ෂකයන්ට ඉගැන්වීමේ පෙරමුණේ සිටින ආයතනයකි.

කලාපයක සමකාලීන කලාවට සහාය වීම යනු නිර්මාණශීලිත්වය පෝෂණය කිරීම පමණක් නොවේ; එය එහි සංස්කෘතික අනන්‍යතාව සංරක්ෂණය කිරීම හා සැමරීම ද වේ. ශ්‍රී ලංකාවේ සාරවත් උරුමය, විවිධ භූ දර්ශන, හා ඓතිහාසික වැදගත්කම යන සියලු දේ, පුළුල් වෙන කලා ක්ෂේත්‍රයකට දායක වී ඇති අතර එය එහි සමාජයේ සංකීර්ණ අනන්‍යතාව පිළිබිඹු කරයි. දිවයිනට සිය නූතන කලා ක්ෂේත්‍රයට අවශ්‍ය නිරාවරණය, අධ්‍යාපනය, හා සම්පත් ලබාදීමෙන් එහි වැඩෙන කලාකරු ප්‍රජාව පෝෂණය කිරීමට ද ඔවුන්ගේ හඬ දේශීය හා ගෝලීය මට්ටමෙන් අනුනාද වන බව සහතික කිරීමට ද හැකිය. වැදගත් ම දේ නම්, රටේ අනන්‍යතාව හැඩ ගැස්වීමේදී හා එහි පුරවැසියන් තුළ සංස්කෘතිය පිළිබඳ ආඩම්බරයක් පෝෂණය කිරීමේදී ශ්‍රී ලංකාවේ සමකාලීන කලාව ඉටු කරන වැදගත් භූමිකාව එහි අනුග්‍රාහකයන් පිළිගත යුතුයි.

දේශීය කලාකරුවන්ව කලාවේ අනුග්‍රාහකයන් සමඟ සම්බන්ධ කිරීම හා, ශ්‍රී ලාංකික කලා ක්ෂේත්‍රය සහ දේශීය හා විදේශීය අනුග්‍රාහකයන් අතර සහයෝගී සබඳතා පෝෂණය කිරීම MMCA ශ්‍රී ලංකාහි ප්‍රයත්නවල වැදගත් කොටසක් වේ. මෙම ප්‍රයත්නයේ පරාවර්තනයක් ලෙස 'ආගන්තුකයෝ' නමින්වූ ඔවුන්ගේ පසුගිය ප්‍රදර්ශනයට එක්සත් රාජධානියේ හා ඉන්දියාවේ සිටින අනෝජි අමරසිංහ සහ හියු මාර්චන්ඩ්, හා රාධිකා චොප්රා සහ රාජන් ආනන්දන්ගේ කාරුණික සහාය ලැබුනේ ය.

ශ්‍රී ලාංකික කලාවට තමා ලබාදුන් සහයෝගය පිළිබඳව කතා කරමින් අනෝජි අමරසිංහ පැවසුවේ, "නූතන හා සමකාලීන කලාව පිළිබඳව MMCA ශ්‍රී ලංකා කරන ගවේෂණය ශ්‍රී ලාංකිකයන්ට පමණක් නොව ලොවපුරා සිටින පුද්ගලයන්ට සමීපව විඳින්න පුළුවන් දෙයක්. ආගන්තුකබව කේන්ද්‍රකරගත් 'ආගන්තුකයෝ' විවිධ සංස්කෘති සමග ගනුදෙනු කිරීමට ජීවිත කාලයක් ම වැයකල මට විශේෂයෙන් ම බලපෑවා. මගේ සැමියා බෙල්ජියම් ජාතිකයෙකු නිසාත් මගේ දරුවන් තැනින් තැනට සංචාරය කරමින් එක තැනකට නොව නොව විවිධ තැන්වලට අයිති වෙමින් වැඩී ඇති නිසා

මගේ පවුල පෙනෙන්නේ මෙලෙස වියහැකි යැයි මට හැඟෙනවා" යනුවෙනි. ඇය තවදුරටත් කියා සිටියේ, "ශ්‍රී ලාංකික කලාව පිළිබඳව MMCA ශ්‍රී ලංකා සමඟ සංවාදයක් පටන් ගැනීමට එය හොඳ ම ආකාරය ලෙස මට දැනුනේ, එය ඔවුන්ගේ පළමු සම්පූර්ණයෙන් සමකාලීන ප්‍රදර්ශනය නිසා. එමෙන් ම, කලා පරිසර පද්ධතියේ සිටින අයට හා සමකාලීන කලාවේ සංවර්ධනයට වඩාත් පුළුල් ප්‍රයෝජනයක් ලබා දෙන, සමකාලීන කලා ලෝකයේ සැකැස්මේ වැදගත් කොටසක් වන MMCA ශ්‍රී ලංකා ආයතනයට අපගේ සහාය දැක්වීමට එය අවස්ථාවක් වුනා" යනුවෙනි.

අමරසිංහ තවත් අවධාරණය කළේ, "තෝරාගත් කිහිපදෙනෙකුගේ රුචියට සීමාවූ කලාවක් නොව, තරුණ ප්‍රජාව ඇතුළත් පුළුල් ජනගහණයක් සමඟ අනුනාදවන කලාවක් අපට අවශ්‍යයි. සංස්කෘතික අධ්‍යාපනයට, අර්ථවත් සංවාද පෝෂණය කිරීමට, හා ගැඹුරු සාමූහික හැඟීමක් ගොඩනැගීමට සමකාලීන කලාව බලවත් මෙවලමක්" කියා ය. "ආයතන අතර සහයෝගිතාව හා පර්යේෂණ සඳහා, ගැලරිකරුවන්ට නියැළීම සඳහා, සහ ශ්‍රී ලාංකික සමකාලීන කලාව වර්ධනය කිරීමේ වර්තමාන ප්‍රයත්නයනට එකතුකරන්නන් හා අනුග්‍රාහකයන්ට සහභාගීවීම සඳහා නව අවස්ථා නිර්මාණය කිරීමට එය වැදගත් ක්‍රමයක් වෙනවා" යැයි ඇය තවදුරටත් පැවසී ය.

නූතන කලාව යනු සමාජයේ නිරන්තරයෙන් වෙනස් වන ගතිකත්වයේ පිළිබිඹුවක් වන අතර එය අවට ලෝකය ගවේෂණය හා අර්ථකථනය කිරීමට හැකි කාචයක් සපයයි. ශ්‍රී ලංකාවේ නූතන කලාකරුවන් ඔවුන්ගේ නිර්මාණශීලිත්වය බැරෑරුම් සමාජ, දේශපාලනික, හා පාරිසරික ගැටලු ආමන්ත්‍රණය කිරීමට යොදා ගන්නා අතර, එමගින් රටේ වර්ධනය වන අනන්‍යතාව පිළිබඳව චින්තනාත්මක විවරණ සපයයි. මෙය, රධිකා චොප්රා 'ආගන්තුකයෝ' සඳහා ලබාදුන් සහාය තුළින් පෝෂණය කිරීමට වෙරදැරූ කලාත්මක ප්‍රයත්නයකි. මේ පිළිබඳව කතා කරමින් ඇය පැවසුවේ, "මම ඉතා දීර්ඝ කාලයක් කලාවලට සහයෝගය ලබාදෙමින් සිටියත්, MMCA ශ්‍රී ලංකාහි 'ආගන්තුකයෝ' සඳහා ලබාදුන් සහාය ශ්‍රී ලංකාවේ අප ලබාදුන් ප්‍රථම ආයතනික සහායයි. ශ්‍රී ලාංකික ඩයස්පෝරාවේ කොටසක් වන මගේ සැමියා හා පවුල නිසාත්, ආයතන ගොඩනැගීම මම සැමවිට ම පුද්ගලිකව උනන්දුවක් දැක්වූ ප්‍රධාන ක්ෂේත්‍රයක් වන නිසාත්, මෙම ප්‍රදර්ශනයේ නාභිය මට තදින් වැදුනා. මහජනතාව සමඟ නියැලෙන කලා වැඩසටහනක් කොළඹ ගොඩනැගීමේ ප්‍රයත්නවලට අපගේ සහාය අවශ්‍ය බවත් අපට හැඟුනා" යනුවෙනි.

ඇය තව දුරටත් පැවසුවේ, " යම් බෙදාගත් අත්දැකීමකට කලාකරුවන් ලබාදුන් පුද්ගලික ප්‍රතිචාර ප්‍රදර්ශනය පුරා ඉතා තියුණුව ගෙතී තිබුනා. ප්‍රදර්ශනයේ සංදර්ශිත 'A Bundle of Joy' (2020) නම් හේමා ශිරෝනිගේ කලාකෘතිය අපගේ පෞද්ගලික එකතුවේ කොටසක් වන අතර, මට දැනුනු විදිහට එය මෙම විෂය පිළිබඳව ගැඹුරින් කථා කළා" යනුවෙනි. චොප්රා වැඩි දුරටත් කියා සිටියේ, "අපගේ සමකාලීන කලාව පිළිබඳව ගෝලීය වශයෙන් පුළුල් සංවාදයක් නිර්මාණය කිරීමට අප ශ්‍රී ලංකාවේ කරන දේ ගෝලීය නරඹන්නන්ට පෙන්වීම හා ඔවුන්ව ඒ සමඟ නියැළීමට සැලස්වීම වැදගත් වෙනවා. මෙය ශ්‍රී ලංකාවේ සංස්කෘතික ආයතනවලට සහාය ලබාදීමේ මහඟු කැපවීමක ආරම්භයක්. උපහාසාත්මක දේ නම්, අපව නිවසට නැවත රැගෙන ආවේ 'ආගන්තුකයෝ' නමින්වූ ප්‍රදර්ශනයක්" කියා ය.

ශ්‍රී ලංකාවේ නූතන හා සමකාලීන කලාවට උඩු දීමට MMCA ශ්‍රී ලංකා කැපවී සිටියි. 'අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය' නම්

ඔවුන්ගේ අලුත් ප්‍රදර්ශනය 2024 ජුලි 7 දක්වා විවෘතව පවතී. ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) යනු සාමාන්‍ය ජනතාව, පාසල්, මෙන් ම සංචාරකයන්ගේ ද ප්‍රයෝජනය හා රසවින්දනය සඳහා නූතන සහ සමකාලීන කලා කෘති ප්‍රදර්ශනය, පර්යේෂණය, රැස්කිරීම, සහ සංරක්ෂණය වෙනුවෙන් කැප වූ පොදු කෞතුකාගාරයක් පිහිටුවීම අරමුණු කරගත් අධ්‍යාපනය පෙරටුකරගත් මුලපිරීමකි. කෞතුකාගාරයට ඇතුල්වීම සහ එහි සියලු වැඩසටහන් ගාස්තුවකින් තොර ය. වැඩි විස්තර සඳහා, www.mmca-srilanka.org වෙත පිවිසෙන්න නැතිනම් facebook.com/mmcasrilanka පිටුව හෝ ඉන්ස්ටාග්‍රෑමයට පිවිසී instagram.com/mmcasrilanka/ නව තොරතුරු දැනගන්න.